# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2082/66 - 2018 අගෝස්තු මස 03 වැනි සිකුරාදා - 2018.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම
7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මාගේ අංකය:* BD/BD /LND /3/5/14.
*ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය :* LD/ 05 /2009/E /55.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු ඉඩමේ /පරවශතාවයේ විස්තර:*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ සුළු කොට්ඨාසයේ, ග්ලෙන් ඇල්පින් (80එච්) ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත්, රඹුක්පොතගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට බදුල්ල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙළ කරන ලද අවසාන ගම් පිඹුරු අංක 37, අතිරේක අංක 50, පත්‍ර අංක 48 හා 2016.10.31 දිනැති අවසාන ගම් පිඹුරේ හෙක්ටයාර් 1.2044 ක් වූ ප්‍රමාණයට පහත දක්වා ඇති ඉඩම් කැබලි හා මායිම් ඇතුළත් උපලේඛනය -01.

01. **කැබලි අංක 1068**

ඉඩමේ නම: අඟුරුපීස්සගොඩ පතන හෙවත් ග්ලේන් ඇල්පින් වත්තේ හිඟුරුගමුව කොටස;ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවු 15-20 ක් පමණ ඇකේෂියා ගස් 06 ක් අවු 10-15 ක් පමණ බෝ ගසක්ද අවු. 10 - 15 ක් පමණ එරබදු ගස් 03 ක් බුදු මැදුරක් සහ ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්ද ඇත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; මුල් හිමිකම් කියන අය: 546 වැනි බිම් කැබැල්ලේ කොටසක්, කොළඹ 03 ගාළු පාරේ අංක 142/9, 1/1 දරන ස්ථානයේ පිහිටි සීමිත බිලියන්ට්ස් ගාමන්ට්ස් (පුද්ගලික) සමාගමට දීර්ඝ කාලීන බද්දක් මත ඉඩම ලබා දීමට මැන ඇත; ප්‍රමාණය: හෙක්. 1.1829.

02. **කැබලි අංක 1068**

ඉඩමේ නම: අඟුරුපීස්සගොඩ පතන හෙවත් ග්ලේන් ඇල්පින් වත්තේ හිඟුරුගමුව කොටස;ඉඩමේ විස්තරය: පතන සහ ලඳු කැළය; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; මුල්



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

හිමිකම් කියන අය: 546 වැනි බිම් කැබැල්ලේ කොටසක්, කොළඹ 03, ගාළු පාරේ අංක 142/9, 1/1 දරන ස්ථානයේ පිහිටි සීමිත බිලියන්ට්ස් ගාමන්ට්ස් (පුද්ගලික) සමාගමට දීර්ඝ කාලීන බද්දක් මත ඉඩම ලබා දී රත්නපුර පාම් ගාඩ්න්හි බලංගොඩ වැවිලි සමාගම විසින් භුක්තිවිඳි ඇත; ප්‍රමාණය: හෙක්. 0.0215.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්/අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් ලත් 2018 සැප්තැම්බර් මස 03 වැනි දින පෙ.ව. 10.30 ට බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා හමුවිය යුතු ය.

තව ද, 2018 අගෝස්තු මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලා සිටීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණනය කළ ආකාරයත් පිටපත් දෙකක් සහිත ලියවිල්ලක් මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

එන්. එම්. ඥානවතී,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2018 ක්වූ අගෝස්තු මස 01 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 691

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.